සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය |
| **இரண்டாம் தவணைப் பரீட்சை - 2018** | **தரம் 11** |
| **Second Term Test - 2018** | **Grade 11** |

| | |
|---|---|
| බුද්ධ ධර්මය - I | කාලය පැය එකයි |
| **பௌத்த சமயம் - I** | **ஒரு மணித்தியாலம** |
| **Buddhism - I** | **Time : One hour** |

* **අංක 1 සිට 40 දක්වා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **ප්‍රශ්න පත්‍රය සමඟ ලබාදෙන කොටු කොළයෙහි ප්‍රශ්න අංකය ඉදිරියෙහි ඇති පිළිතුරට අදාළ ඉලක්කම තුළ කතිරය (×) සලකුණු කරන්න.**

1. **පංච මහා විලෝකනය** යනුවෙන් අදහස් කරනුයේ,
   1. දේවතාරාධනාව පිළිගැනීම යි.
   2. ලෝකධාතු පහක් පිළිබඳ ව සොයා බැලීම යි.
   3. අවසන් උපතට සුදුසු පසුබිම විමසීම යි.
   4. මිනිස් කුල පහක් පිළිබඳ ව සොයා බැලීම යි.

2. ලොව්තුරා බුද්ධත්වය ලබා ගැනීමේ දී බෝසතාණන් වහන්සේ මුහුණ දුන් **දුෂ්කර ම** අභියෝගය වන්නේ,
   1. පාත්‍රය උඩුගම් බලා යාම යි.
   2. පස්වග තවුසන් බෝසතුන් හැර යාම යි.
   3. සත් සතිය ගත කිරීම යි.
   4. දස මාර සේනාව පරාජය කිරීම යි.

3. බුද්ධත්වය ලබා ගත කළ පන්සාලිස් වස තුළ ම සිව්පසය නොලැබුණු, කටුක ආහාරයෙන් යැපුණු වස් කාලය ගත කළේ,
   1. භේෂකලා පර්වතයෙහි ය.
   2. පාරිලෙය්‍ය වනයෙහි ය.
   3. වේරංජා පුරයෙහි ය.
   4. බරණැස ඉසිපතනයෙහි ය.

4. **'රහසත් පව් නොකොට'** යනුවෙන් ආරම්භ වන කවියෙන් විස්තර වන බුදු ගුණය,
   1. අරහං බුදු ගුණය වේ.
   2. සුගත බුදු ගුණය වේ.
   3. ලෝක විදූ බුදු ගුණය වේ.
   4. සත්ථා දේව මනුස්සානං බුදු ගුණය වේ.

5. අප බෝසතාණන් වහන්සේ පිරූ පාරමිතා අතුරින් **වට්ටක ජාතකයෙන්** කියැවෙන පාරමිතාව වන්නේ.
   1. වීර්ය පාරමිතාව යි.
   2. සත්‍ය පාරමිතාව යි.
   3. අධිෂ්ඨාන පාරමිතාව යි.
   4. උපේක්ෂා පාරමිතාව යි.

6. සිත කිලිටි කරන, නිවන් මග අවුරාලන, ක්ලේශ ධර්ම යටපත් කරන භාවනාව කුමක් ද?
   1. අසුභ භාවනාව යි.
   2. විදර්ශනා භාවනාව යි.
   3. සමථ භාවනාව යි.
   4. කායගතාසති භාවනාව යි.

7. අපට එළැඹෙන ගැටලු වලට විසඳුම් සෙවීමේ දී **රෝග නිධානය සොයා පිළියම් කරන වෙදදුරෙකු ලෙස** නුවණින් විමසා ක්‍රියා කළ යුතු ය. මෙය අර්ථවත් වන පාලි පාඨය නම්,
   1. සතිමතෝ ය.
   2. සුචිකම්ම ය.
   3. නිසම්මකාරිනෝ ය.
   4. ධම්මජීවිනෝ ය.

8. එක් එක් පුද්ගල චරිතවල ස්වභාවය අනුව කර්මස්ථාන ලබා දීම සමථ භාවනාවේ ස්වරූපය යි. එම සමථ භාවනාවට අයත් කර්මස්ථාන ගණන,

1. නවය කි.
2. දහසය කි.
3. විසි හතර කි.
4. හතළිහ කි.

9. සිල් ආරක්ෂා කිරීමෙන් ලැබෙන ආනිශංස බොහෝ ය. ඒ අතරට අයත් **නොවන** කරුණකි.

1. කීර්තිය පැතිරීම.
2. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම.
3. සිහි මුළා වී කලුරිය කිරීම..
4. මරණින් මතු සුගතියෙහි ඉපදීම.

10. සිගාලෝවාද සූත්‍රයේ ඉගැන්වෙන සමාජ යුතුකම් අතර '**තම ස්වාමියාට පළමු ව පිබිදීම**'

1. සේවකයාගේ යුතුකමකි.
2. බිරිඳගේ යුතුකමකි.
3. සේව්‍යයාගේ යුතුකමකි.
4. ගිහියාගේ යුතුකමකි.

11. සහජීවනය වර්ධනය කරගැනීමට බුදු දහමේ ඉගැන්වෙන ධර්ම කරුණු තුළ නූතනයට ගළපාගත හැකි හා නූතන සමාජය සුවිශේෂී ව වටහා ගතයුතු කරුණකි **අත්තූපනායික ධර්ම පර්යාය.** එමගින් අදහස් කරනුයේ,

1. තමා උපමාකොට වරදින් මිදීම යි.
2. තමා ගැන සිතා වරදින් මිදීම යි.
3. ධර්මය ගැන සිතා වරදින් මිදීම යි.
4. අනුන් ගැන සිතා වරදින් මිදීම යි.

12. අයහපත කරන්නා යහපත කිරීමෙන් ජයගත යුතු ය. මෙම අදහස සහිත පාලි පාඨය කුමක් ද ?

1. ''අක්කෝධේන ජිනේ කෝධං''
2. ''අසාධුං සාධුනා ජිනේ''
3. ''ජිනේ කදරියං දානේන''
4. ''සච්චේන අලික වාදිනං''

13. අප විසින් ජීවන පුරුදු ලෙස සිදුකරනු ලබන දන්දීම, සිල්රැකීම, භාවනා කිරීම ආදියට කුසලාකුසල කර්ම විපාකය හිමි වන්නේ,

1. ගරුක කර්ම යටතේ ය.
2. ආසන්න කර්ම යටතේ ය.
3. ආචින්න කර්ම යටතේ ය.
4. කටත්තා කර්ම යටතේ ය.

14. වැරදි ආහාර පුරුදු සහිත පුද්ගල චරිත අතර අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාර ගන්නා තරමට ගිජු ලෙස ආහාර ගන්නා තැනැත්තා බුදුදහමට අනුව හඳුන්වන්නේ,

1. අලංසාටක නමිනි.
2. තත්ථවට්ඨක නමිනි.
3. කාකමාසක නමිනි.
4. භුත්තවමිතක නමිනි.

15. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමෙන් තමාට සිදුවන අකුසල කර්ම විපාක මගහරවාගත හැකි ය. මෙය

1. ගති සම්පත්තිය යි.
2. උපධි සම්පත්තිය යි.
3. කාල සම්පත්තිය යි.
4. ප්‍රයෝග සම්පත්තිය යි.

16. මෙය නැති කල්හි මෙය නොවේ අදහස සහිත පාලි පාඨය නම්,

1. ඉමස්මිං සති ඉදං හෝති වේ.
2. ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති වේ.
3. ඉමස්මිං අසති ඉදං න හෝති වේ.
4. ඉමස්ස නිරෝධා ඉධං නිරුජ්ඣති වේ.

17. භාරතයේ පැවති සිව්වන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූයේ,

1. අජාසත්ත රජතුමා ය.
2. කාලාශෝක රජතුමා ය.
3. ධර්මාශෝක රජතුමා ය.
4. කණිෂ්ක රජතුමා ය.

18. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ගේ අදහසට අනුව චතුරශ්‍රාකාර ව පැවති ස්තූපයකි,

1. පොළොන්නරුව සත්මහල් ප්‍රාසාදය.
2. කතරගම කිරි වෙහෙර.
3. කැළණි විහාරයේ දාගැබ.
4. මහියංගණ ස්තූපය.

19. '**ආයක**' නම් විශේෂ නාමයෙන් හඳුන්වන බෞද්ධ කලා නිර්මාණයක් ඇත. එය

1. වටදාගෙය යි.
2. වාහල්කඩ යි.
3. බෝධිඝරය යි.
4. සඳකඩපහණ යි.

20. මුරගල විකාශනයේ දියුණු ම අවස්ථාව පෙන්වන සාධකයකි
1. මිනිස් වෙස්ගත් නා රජ කැටයම. 2. වාමන රූපය.
3. මකර රූපය. 4. නෙළුම් මල.

21. දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ නොමද අවධානය දිනාගත් කලා නිර්මාණයන් අතුරින් සඳකඩපහණ සුවිශේෂී වූවකි. එහි නිර්මාණ පෙළගැස්මෙහි තෙවන ස්ථානයට පිහිටුවා ඇත්තේ,
1. ඇත් අස් ගව සිංහ රූප වේ. 2. සංකීර්ණ ලියවැල වේ.
3. තුඩින් නෙළුම් පොහොට්ටු රැගත් හංස පෙළ වේ 4. සරල ලියවැල වේ.

22. පහත සඳහන් ස්ථානයන් අතුරින් පොළොන්නරු යුගයේ චිත්‍ර දැකිය **නොහැකි** ස්ථානය කුමක් ද ?
1. මහියංගණ ස්තූපයේ ධාතු ගර්භය 2. දිඹුලාගල ලෙන්
3. තිවංක පිළිම ගෙය 4. හිඳගල විහාරය

23. පෞරාණික සංස්කෘතික දායාද ආරක්ෂා කිරීමේ අප සතු වගකීම් අතරට අයත් එක් කාර්ය භාරයකි
1. ඉපැරණි ගඩොල් ආදී බැම් මත ඇවිද යාම. 2. ඉපැරණි නිර්මාණ විකෘති කිරීම.
3. සංරක්ෂිත ස්ථාන අපිරිසිදු කිරීම. 4. ඉපැරණි නිර්මාණ ආරක්ෂා කිරීමට දායක වීම.

24. හෙළ අටුවා ග්‍රන්ථ තුළ සමස්ත අන්තර්ගතය සැලකූ විට ඒවායෙහි ඇතුළත් ව ඇත්තේ
1. ත්‍රිපිටක ධර්මයට සිංහලෙන් සැපයූ අර්ථකථන ය.
2. ජාතක කතාවන්හි සංක්ෂිප්ත අදහස ය.
3. භික්ෂු විනය හා ප්‍රඥප්තීන් ය.
4. හෙළ දීපය තුළ කළ කතිකාවත් හි සම්මුතීන් ය.

25. බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතරට අයත් උප කරුණක් වන **'දිළිඳු ජනයාට ධනය දෙන්න'** යන ප්‍රකාශය
1. සප්ත අපරිහානීය ධර්මවලට අයත් වේ. 2. දසරාජ ධර්මවලට අයත් වේ.
3. දස සක්විතිවත්වලට අයත් වේ. 4. සතර සංග්‍රහ වස්තුවලට අයත් වේ.

26. පාසලට පැමිණි අන්‍යාගමික නවක සිසුවෙකු බුද්ධධර්මය විෂයයක් ලෙස හදාරා ඇති වූ පැහැදීම හේතුවෙන් සසර කෙටිකර ගැනීමට අවශ්‍ය බවත්, නිවන කරා යාමට තමාට අවශ්‍ය බවත් පවසයි. ඒ සඳහා ඔහු මුලින් ම කළයුතු කාර්යය කුමක් ද?
1. රාගය දුරුකළ යුතු ය. 2. ද්වේෂය දුරුකළ යුතු ය.
3. මෝහය දුරුකළ යුතු ය. 4. සැදැහැවත් විය යුතු ය.

27. බොහෝ දරුවන් අතර සැබෑ බොදු දරුවෙකු හඳුනාගත හැකි සුවිශේෂී පෞරුෂ ලක්ෂණයකි
1. අභියෝග නොසලකා හැරීම. 2. අභියෝග ජයගෙන ඉදිරියට ම යාම.
3. අභියෝග හමුවේ පසුබැසීම. 4. අභියෝග පිළිබඳ නොසිතා ජීවත් වීම.

28. බෝසතාණන් වහන්සේ ....................... පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය තේමිය ජාතකයෙන් ප්‍රකට වේ.
1. සත්‍ය 2. අධිෂ්ඨාන 3. මෛත්‍රී 4. උපේක්ෂා

29. ථීනමිද්ධ නීවරණය යනු,
1. සිත කය දෙකෙහි පවත්නා අලස බව යි. 2. තරහව යි.
3. සිතෙහි නොසංසුන් බව හා පසුතැවිල්ල යි. 4. සැකය යි.

30. භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ලබාගතහැකි ප්‍රයෝජනයක් **නොවන්නේ,**
1. ගැටලු විසඳීමට නොහැකි වීම ය. 2. එක අරමුණකින් වැඩකළ හැකි වීම ය.
3. මතක ශක්තිය දියුණු වීම ය. 4. ඉවසීමේ හැකියාව වර්ධනය වීම ය.

31. 1873 දී ඇතිවූ පානදුරා වාදයේ දී ක්‍රිස්තු භක්තිකයන් පරාජය කොට ඔවුන් ඉදිරිපත් කළ සියලු තර්ක විතර්ක බිඳහෙලූ ශ්‍රේෂ්ඨ නායකයෙකු ලෙස ...................... සැලකිය හැකි ය.
    1. වාරියපොල සුමංගල නාහිමි    2. මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමි
    3. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා    4. අනගාරික ධර්මපාල තුමා

32. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රි ශික්ෂාවට අනුව බෙදූ විට සීල ශික්ෂාවට අයත් අංගයකි
    1. සම්මා සංකප්ප.    2. සම්මා ආජීව.    3. සම්මා සති.    4. සම්මා සමාධි.

33. බුදුරජාණන් වහන්සේ විසින් චින්තන නිදහස පිළිබඳ කියවෙන කාලාම සූත්‍රය දේශනා කළේ,
    1. දීඝජානු කෝලිය පුත්‍රයාට ය.    2. සිගාල නම් තරුණයාට ය.
    3. දෙවියන්ට ය.    4. කේසපුත්ත වැසියන්ට ය.

34. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව තණ්හාව නැතිකළ විට
    1. දුඩිව අල්ලා ගැනීම නැති වේ.    2. වේදනාව නැති වේ.
    3. ආයතන සය නැති වේ.    4. ඉපදීම නැති වේ.

35. පමණ දැන ආහාර නොගැනීම නිසා ඇතිවන ප්‍රතිඵල අතරින් එකකි
    1. නිදුක් බව ඇතිවීම.    2. සුවපහසු පැවැත්ම ඇතිවීම
    3. සැහැල්ලු බව ඇතිවීම    4. පහසුවෙන් රෝගාබාධයන්ට ගොදුරු වීම.

36. ජලයෙන් ගොඩගෙන බිම තැබූ මත්ස්‍යයෙකු මෙන් මේ සිත (කෙලෙස් හේතුවෙන්) සැලෙයි. මෙම අදහස ඇතුළත් ගාථාවේ මුල් පාදය තෝරන්න.
    1. 'දූරංගමං ඒකචරං ....'    2. 'සුජීවං අහිරිකේන ....'
    3. 'වාරිජෝව ථලේ කිත්තෝ ....'    4. 'අක්කෝධේන ජිනේ කෝධං ....'

37. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව ශාසනික චිරස්ථිතියට බෙහවින් ම ඉවහල් වූ ධර්ම සංගායනා කිහිප අවස්ථාවක දී සිදු කරන ලදී. ඒවා අතරින් දෙවන ධර්ම සංගායනාව ද ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. එය පැවැත්වීමට ගත වූ කාල සීමාව
    1. මාස තුන කි.    2. මාස හත කි.
    3. මාස අට කි.    4. මාස නවය කි.

38. ශ්‍රී ලංකාවේ බෞද්ධ ජන ජීවිතයට ම ආවේණික වන්දනාමාන හා පුදසිරිත් ක්‍රමයක් බිහිවීම
    1. බෝධි ආගමනයේ ප්‍රතිඵලය කි.    2. සිව්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලය කි.
    3. බෞද්ධ සාහිත්‍ය බිහිවීමේ ප්‍රතිඵලය කි.    4. මහින්දාගමනයේ ප්‍රතිඵලය කි.

39. තමාගේ ආදායම ඉක්මවා වැය නොකිරීම හෙවත් අයවැය මනා ව තුළනය කර ගැනීම
    1. උට්ඨාන සම්පදා නම් වේ.    2. ආරක්ඛ සම්පදා නම් වේ.
    3. කල්‍යාණ මිත්තතා නම් වේ.    4. සමජීවිකතා නම් වේ.

40. බුදුරජාණන් වහන්සේ තුළ පැවති අනුපමේය ගුණයන් අතුරින් තාදි ගුණය මැනවින් ප්‍රකටවන අවස්ථාවකි
    1. මංගල සූත්‍රය දේශනා කිරීම.    2. කොසඹෑ නුවර භික්ෂු අර්බුදයට මුහුණදීම.
    3. අංගුලිමාල දමනය කිරීම.    4. පළමු ධර්ම දේශනය පැවැත්වීම.